# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2130/39 - 2019 ජූලි මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2019.07.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: ඩීඅයිවීඅයිබී/එල්එන්ඩී/එල්ඒඩීඒකියු/සීආර්පී/05/2015/14.

*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/7/2016/එච්ඩබ්ලිව්/498.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබාගැනීමට රජය අදහස් කරන බැව්,1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ /පරවශ්‍යතාවයේ විස්තරය:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 522, බක්මීගොල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පරණගම්පිටිය ගමෙහි සර්වේයර් ජනරාල්ගේ අවසාන ගම් පිඹුරු අංක 1187, අතිරේක අංක 05 හා 2019.06.12 දිනැති පත්‍ර අංක 07 හි කැබලි අංක 14903 - 14912 (කැබලි 6 ක්) වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.9898 පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි.

1\. කැබලි අංක 14903

ඉඩමේ නම: පරණගම්පිටිය එස්ටේට්; ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: කැබලි අංක 14886, මු.පි. 3016 හි කැබලි අංක 13427, 13420, 13430, 13431, 13432, 13429 සහ 13425 හි කොටස් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ පවරාගන්නා ලදී. මුල් හිමිකම් පාන්නා අබේගොඩ ගීකියනගේ චාන්දනී අල්ගම. අත්කරගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්. 2.2803.

2\. කැබලි අංක 14904

ඉඩමේ නම: පරණගම්පිටිය එස්ටේට්; ඉඩමේ විස්තරය: වතුයාය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: කැබලි අංක 14887 හි කොටසක් මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා අවශ්‍යව ඇත; ප්‍රමාණය: හෙක්. 0.2921.

3\. කැබලි අංක 14906

ඉඩමේ නම: පරණගම්පිටිය එස්ටේට්; ඉඩමේ විස්තරය: වතුයාය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: මු.පි. 3016 කැබලි අංක 13425 හි කොටසක් අබේගොඩ ගීකියනගේ චාන්දනී අල්ගම අනවසරයෙන් අල්ලා ගන්නා ලදී. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා අවශ්‍යව ඇත; ප්‍රමාණය: හෙක් 0.1276.

4\. කැබලි අංක 14908

ඉඩමේ නම: පරණගම්පිටිය එස්ටේට්; ඉඩමේ විස්තරය: මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: මු.පි. 1296 කැබලි



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

අංක 6826 B හි කොටසක් මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා අවශ්‍යව ඇත. ; ප්‍රමාණය: හෙක් 0.0823.

5. **කැබලි අංක 14911**

ඉඩමේ නම: පරණගම්පිටිය එස්ටේට්; ඉඩමේ විස්තරය: මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: කැබලි අංක 14891 හි කොටසක් මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා අවශ්‍යව ඇත; ප්‍රමාණය: හෙක් 0.0566.

6. **කැබලි අංක 14912**

ඉඩමේ නම: දැදුරු ඔය; ඉඩමේ විස්තරය: ඔය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: කැබලි අංක 14891 හි කොටසක් මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා අවශ්‍යව ඇත; ප්‍රමාණය: හෙක් 0.1509.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2019 අගෝස්තු මස 28 වැනි දින පෙ. ව. 9.30 ට ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2019 අගෝස්තු මස 21 වන දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

එම්. ඒ. එස්. මාරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉබ්බාගමුව.

ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 641

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.